# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## විදුලි සංදේශ නිලධාරී - II ශ්‍රේණිය  තනතුරට බඳවා ගැනීම (බාහිර)

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන්  අයදුම්පත් කැඳවනු ලැබේ.**

**(1) රැකියා විස්තරය**

- මිනුම් සහ පරීක්ෂණ උපකරණ නඩත්තු කිරීම.
- තාක්ෂණික ප්‍රමිතීන් සහ අනුකූලතා පරීක්ෂණ පැවැත්වීම.
- නිරෝධන මැනීම( interference measurement ) , ක්ෂේත්‍ර ශක්තිය (field strength )සහ බල මිනුම් (Power Measurements )පිළිබඳ කාර්යයන්හී නිරත වීම.
- තාක්ෂණික විමර්ශන පැවැත්වීම සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- තාක්ෂණික උපකරණ ප්‍රසම්පාදනය සහ අනෙකුත් අදාළ ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL)  රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීමේදී කළමනාකාරිත්වයට සහාය වීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ කොමිෂන් සභාව විසින් පිළිගත් වෘත්තිය පුහුණු ආයතනයකින් පිරිනමනු ලබන NVQ 5 මට්ටමට හෝ  SLQF 3 මට්ටමට නොඅඩු  ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ කටුබැද්ද NDT ඩිප්ලෝමාව හෝ ඊට සමාන හෝ උසස් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකමක් ලබා තිබිම.

සහ

අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් පසු විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 3ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ.  තරඟ විභාගයේ සමස්ථ ලකුණු සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් කුසලතා අනුපිළිවෙල මත  පමණක් පත්වීම් සිදු කෙරේ. (I)  භාෂා ප්‍රවීණතාවය සහ බුද්ධි පරීක්ෂණය   (II) තනතුරට අදාළ විෂයය දැනුම  ලිඛිත විභාගයේ විෂයයන් වේ .

**(4) වැටුප:-**   TRC 5.2     -රු. 62560 (10x1173) -(10x1564) -(10x1955) -(10x2346) – 132940.  මෙම තනතුරට පත් කරනු  ලබන සියලුම නව පත්වීම් මෙම රැකියා කාණ්ඩයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

**(5) වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු.18-45 අතර විය යුතුය.

**(6) අයදුම් කිරීමේ ක්‍රමය**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ  නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk. වෙතින් බාගත කර ගත හැකිය.
2. නියමිත  ආකෘතිය  අනුව  පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන  අයදුම්පත් සලකා බලනු නොලැබේ
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2025.03.05 දින හෝ එදිනට පෙර**  **"අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08"** යන ලිපිනයට  ලැබෙන සේ  ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර  ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "**විදුලි සංදේශ නිලධාරී - II ශ්‍රේණියේ තනතුර (බාහිර)   සඳහා අයදුම්පත** " යනුවෙන් සඳහන් කළ යුතුය.
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lkවිද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව "**විදුලි සංදේශ නිලධාරී - II ශ්‍රේණිය   තනතුරට බඳවා ගැනීම (බාහිර)  - 2025**" විය යුතුය.
7. රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් **2025.03.05 දින හෝ එදිනට  පෙර** ලැබෙන සේ  ඉදිරිපත් කළ යුතුය.

**(7) පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින්  බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.


අධ්‍යක්ෂ ජනරාල්<br>
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව<br>
අංක 276<br>
ඇල්විටිගල මාවත<br>
කොළඹ 08